**PAFFREL**

**නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.**

**சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.**

**PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS**

ගරු ජනාධිපති,
අනුර කුමාර දිසානායක මහතා,
ජනාධිපති ලේකම් ලේකම් කාර්යාලය,
කොළඹ 01.
2024-09-27

ගරු ජනාධිපතිතුමනි,

**බොහෝ අභියෝග මැද ශ්‍රී ලංකාවේ 9 වන විධායක ජනාධිපතිවරයා ලෙස ඔබතුමන් පත්වීම පිළිබඳව පැෆ්රල් සංවිධානය එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ කාර්ය මණ්ඩලයේ සුභාශිංෂන පිරිනමමු.**

ශ්‍රී ලංකාව මුහුණදී ඇති ආර්ථික සමාජයීය හා දේශපාලන අර්බුදය හමුවේ රට ගොඩනැගීමේ කාර්ය සිදුකල හැක්කේ සාමූහික ප්‍රයත්නයකින් බව අපගේ විශ්වාසයයි. ඒ සඳහා පරිපාලන සේවයේ නිලධාරීන් ඇතුලු අනෙකුත් වෘත්තික කණ්ඩායම්, වෘත්තිය සමිති, ව්‍යාපාරික ප්‍රජාව, සිවිල් සංවිධාන, සියලු දේශපාලන කණ්ඩායම්, කෘෂිකාර්මික ප්‍රජාව ඇතුලු සියලු ක්ෂේත්‍රවල පිරිස් සමග අඛණ්ඩ සාකච්ඡාවකින් හා සම්මුතීන් ඇතිකරගනිමින් ශ්‍රී ලාංකික ජාතිය හා රට ගොඩනැගීමට ඔබට හැකිවනු ඇතැයි අප වැඩිදුරටත් විශ්වාස කරමු.

එමෙන්ම ඔබ පක්ෂය ජනතාව සමග ඇතිකරගත් පොරොන්දු පත්‍රය වන ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව යමින් ජනතාවට ලබාදුන් පොරොන්දු ඉටුකිරීමට ඔබට ශක්තිය හා ධෛර්යය ප්‍රාර්ථනා කරමු. එකී ප්‍රතිපත්ති ප්‍රකාශනයේ වූ කරුණු නිශ්චිත කාල රාමුවකට අනුව ක්‍රියාත්මක කරනු ඇතැයි අප විශ්වාස කරන අතර ඒ පිළිබඳව වාර්ෂික ඇගයීමේ ක්‍රියාවලියක් ආරම්භ කිරීමට අප බලාපොරොත්තු වන බැවින් ඒ සඳහා ඔබතුමන් ප්‍රමුඛ ආණ්ඩුවේ සහයෝගය අප බලාපොරොත්තු වෙමු.

අවසාන වශයෙන් අප විසින් වසර ගණනාවක් මුලුල්ලේ සාකච්ඡා කරන මැතිවරණ ප්‍රතිසංස්කරණ වන මැතිවරණ කොමිෂන් සභාවේ මූල්‍ය ස්වාධීනත්වය, මැතිවරණ වලදී විශේෂ අවශ්‍යතා ඇති අයට අවශ්‍ය පහසුකම් පුලුල් කිරීම, මැතිවරණ කාලසටහන යථාර්ථයක් බවට පත්කිරීම, කාන්තා හා තරුණ නියෝජනය පුලුල් කිරීම, විදේශගතව සිටින පිරිස් වල ඡන්ද අයිතිය තහවුරු කිරීම, දේශපාලන පක්ෂවල ප්‍රජාතන්ත්‍රවාදී භාවිතාවන් පුලුල් කිරීම හා ජනතාවට වගකියන පාර්ශවයක් බවට පත්කිරීම වැනි ප්‍රතිසංස්කරණ ඔබගේ ධුර කාලය තුළ යථාර්ථයක් බවට පක්කරගැනීමට කටයුතු කරනු ඇතැයි අප දැඩිසේ විශ්වාස කරමු.

ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම, නීතියේ පාලනය තහවුරු කිරීම සහ අල්ලසින් දූෂණයෙන් තොර රටක් බිහිකරගැනීම සඳහා ඔබගේ රජය ගනු ලබන ක්‍රියාමාර්ග සඳහා පැෆ්රල් සංවිධානයේ පූර්ණ සහයෝගය ඔබ වෙත ලබාදෙන බවද සතුටින් ප්‍රකාශ කරමු.

රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂ

#No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06.
Tel : (+94) 11 2558570 / 11 2558571 Fax : (+94) 11 2558572
Email : paffrel@sltnet.lk Web : www.paffrel.com